177

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/2023

4 වන මට්ටම - අවසාන පරීක්ෂණය

**EPU4531 - ඉගෙනුම් ඉගැන්වීම් පර්යාලෝක.**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2024.03.09 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## <u>1 - වන කොටස</u>

01. ප්‍රාථමික ගුරුවරුන්ට අධ්‍යාපන දර්ශනය පිළිබඳ දැනුම වැදගත් බව පෙන්වීමට හේතු පහක් **(05)** සඳහන් කරන්න.

02. පෙස්ටෝලොසිගේ අධ්‍යාපනික දර්ශනය ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට අදාළ කර ගත හැකි ආකාරය කෙටියෙන් සාකච්ඡා කරන්න.

03. ප්‍රීතිමත් ඉගෙනුම් ක්‍රියා මාර්ගයක් ලෙස සෙල්ලම් තුලින් ඉගැන්වීමේදී ගුරුවරයාගේ භූමිකාව කෙටියෙන් සාකච්ඡා කරන්න.

04. ප්‍රශ්නකරණය තක්සේරුකරණ උපකරණයක් ලෙස භාවිත කිරීමේදී අවධානය යොමුකළ යුතු විශේෂිත ක්‍රම ශිල්ප හතරක් **(04)** සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

05. ඉගෙනුම් උපාය මාර්ගයක් ලෙස **" නිරූපනය"** ඔබ පන්ති කාමරයට යොදාගන්නේ කෙසේද, උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

06. ළමා හිතකාමී ඉගෙනුම් පරිසරයක් කෙරෙහි බලපාන සාධක හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පහත සඳහන් අයට තක්සේරුකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.
    (a) ගුරුවරුන්ට
    (b) සිසුන්ට
    (c) දෙමව්පියන්ට

08. ළමයින් පළමු ශ්‍රේණියට ඇතුළත් වන විට සිදුකරණු ලබන ප්‍රවේශ නිපුණතා ක්‍රියාකාරකම් වලින් එක් ක්‍රියාකාරකමක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## 02 - කොටස

09. (i.) 1997 ප්‍රතිසංස්කරණ වලින් ප්‍රාථමික අධ්‍යාපනයට හඳුන්වාදුන් ප්‍රධාන අවධි තුනෙහි **(03)** ඇතුලත් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුනතා ඒ ඒ අවධි වලදී සාක්ෂාත් කරගැනීමේ වැදගත්කම උදාහරණ සමඟින් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික අධ්‍යාපනයෙන් ද්විතියක අධ්‍යාපනයට සුමට සංක්‍රාන්තියක් සිසුන්ට ලබාදීමට ප්‍රාථමික ගුරුවරයෙකු ලෙස ඔබගේ භූමිකාව විභාග කරන්න. (ලකුණු - 10)

10. (i.) ළමා සංවර්ධනය කෙරෙහි පරිසරයේ බලපෑම පිළිබඳ යූරි බ්‍රොන්ෆෙන්බ්‍රනර් විසින් හඳුන්වා දුන් පෞද්ගලික සංවර්ධනය පිළිබඳ පාරිසරික විද්‍යාත්මක ආකෘතිය රූප සටහනක් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) එම ආකෘතිය ප්‍රාථමික පාසල් පන්ති කාමරයට ඔබ භාවිත කරන අයුරු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 10)

11. (i.) Aggrawal සහ Gupta (2007) සඳහන් කරන පරිදි ඉගෙනුම් ආධාරක භාවිතයේදී ගුරුවරයකු විසින් සැලකිය යුතු මූලධර්ම පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික පාසල් මට්ටමේ දී පහත සඳහන් ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක ඵලදායි ලෙස භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න.

(a) කළු පුවරුව භාවිතා කිරීම
(b) පින්තූර භාවිතය
(c) පෙළපොත් භාවිතය (ලකුණු - 10)

12. (i.) ළමා හිතකාමී ඉගෙනුම් පරිසරයක ලක්ෂණ විශ්ලේෂණය කරන්න. (ලකුණු - 10)

(ii.) ඔබ, භෞතික හා මනෝවිද්‍යාත්මක ඉගෙනුම් පරිසරය ඵලදායි ආකාරයෙන් සැලසුම් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු - 10)

13. (i.) වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන වඩාත් අර්බුධකාරී ගැටළු තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු - 06)

(ii.) එම ගැටළු නිර්මාණය කිරීමට දායකත්වය දැක්වූ සාධක විශ්ලේෂණය කරන්න. (ලකුණු - 06)

(iii.) ඉහත හඳුනාගත් එක ගැටළුවක් විසඳීමට ඔබට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු - 08)

- හිමිකම් ඇවිරිණි. -